# පළලවෙනි සභාපතිත්වයේ සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ, නොවැම්බර් 2012

## ආශිර්වාද ගැන සලකාබලන්න

සභාපති තෝමස් එස්. මොන්සන් විසිනි

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ අවශ්‍යතාවයන් ගැන දැනසිටින අතර, උන්වහන්සේගෙන් පිහිට ඉල්ලා සිටින විට අපට උපකාරකරනසේක.

මා ආදරණීය සොයුරු සොයුරියනි, මෙම සම්මමන්ත්‍රනය ප්‍රේරිතවරුන් දොලොස්දෙනාගේ සමාජිකයෙක් ලෙස මා ස්ථිරකල 1963 ඔක්තෝබර් 4වෙනිදා සිට 49ක වසරක් සමරයි. අවුරුදු හතලිස්-නමයක් යනු දීර්ඝ කාලයකි. කෙසේ වෙතත්, මා දේවස්ථානයේ දේවාසනයේ සිටගෙන ප්‍රධාන සම්මන්ත්‍රනයේදී මගේ ප්‍රථම කථාව කළදා සිට කාලය නොයෙක් ආකාරයෙක් පෙනෙන්නේ ඉතා කෙටි ලෙසය.

බොහෝ දේවල් 1963 ඔක්තෝබර් 4වෙනිදා සිට, වෙනස්වී ඇත. ලෝක ඉතිහාසයේ අද්විතීය ස්ථානයක අපි ජීවත්වන්නෙමු. අපි ඉතා විශාලලෙස ආශිර්වාද ලබා ඇත්තෙමු. එහෙත් සමහර අවස්ථාවලදී අප වටා තිබෙන ප්‍රශ්න සහ අවකාශයන් මගින් අධෛර්‍යයවී නැත. අසුභවාදීව සිටිනවා වෙනුවට, අපි පියවරක් පසුපසට ගෙන අපගේ ජීවිතවල ආශිර්වාද ගැන සිතනවිට, කුඩාවට පෙනෙන දේවල්ද, සමහර විට, නොපෙනුන ඒවාද, සමග අපට විශාල සතුටක් ලබාගත හැකි බව මට පෙනීගොස් ඇත.

ගතවූ අවුරරුදැ 49 ගැන නැවත බලන විට, මම සොයාගැනීම් කිහිපයක් කර ඇත්තෙමි. මම ලබා තිබෙන ගිණිය නොහැකි අත්දැකීම් අසාමන්‍ය දේ සමග සලකාබැලීම අවශ්‍ය නැත. ඇත්ත වශයෙන්ම, ඒවා සිදුවූ අවස්ථාවලදී, ඒවා නිතර පෙනුනේ විශිෂ්ට නොවන, සාමාන්‍ය දේවල් ලෙසය. එහෙත් ආවර්ජනයකිරීමේදී, ඒවා ආශිවාදිත ජීවිත සාරවත්කර ඇත අඩුම දේ වත් මගේ නොවන්නේය. මෙම අභ්‍යාසයම මම ඔබට නිර්දේශකරමි නාමිකව, ඔබගේ ජීවිතයේ වැඩලේඛනයක් ගෙන, විශේෂයෙන්ම ඔබ ලබාතිබෙන කුඩා, සහ විශාල ආශිර්වාද දෙස බලන්න.

නැවත බැලීම් තුලින් වසර මගේම දැක්ම නිරන්තරයෙන්ම ගණනාවක් ශක්තිමත්වී මට අවබෝධ වූයේ අපගේ යාච්ඤා අසා පිළිතුරුදී ඇති බවය. මෝර්මන්ගේ පොතේ 2 නෙපී සඳහන් සත්‍යය අපට හුරු පුරුදුය: මනුෂ්‍යයන් පැවතෙන්නේ එනම් ප්‍රීතිය තිබෙන පිණිසය. 1 එම ප්‍රීතියෙන් බොහොමයක් ලැබෙන්නේ යාච්ඤාව තුලින් අපට අපගේ ස්වර්ගික පියාණන් හා කථාකිරීමට හැකි බව සහ එම යාච්ඤා අසා පිළිතුරු දී ඇතිබව අප හඳුනාගත් විටදී බවට මම සාක්ෂිදරමි ඒවා අසා පිළිතුරු දෙන අන්දම සහ දවස අප සමහරවිට අපේක්ෂාකරන්නේ නැත, නමුත් ඒවාට පිළිතුරු *ලැබේ*, අපව දැනගෙන අපට පරිපූර්ණව ප්‍රේමකරන ස්වර්ගික පියාණන්ගේ ආශාව අප සතුටින් සිටීමය.

උන්වහන්සේ අපට පොරොන්දුවී නොමැතිද, නුඹලා යටහත්වෙයල්ලා; තවද ස්වාමීන්වන නුඹලාගේ දෙවියන්වහන්සේ නුඹලාට හස්තයෙන් මගපෙන්වා, නුඹලාගේ යාච්ඤාවලට පිළිතුරු දෙනසේක"? 2 මම වෙන් කර තිබෙන ඊළඟ මිනිත්තු කහිපයේදී මා ලබා තිබෙන නිදර්ශන අත්දැකීම් ඔබ සමග බෙදාගැනීමට මම කැමැත්තෙමි. එමගින් යාච්ඤා අසා පිළිතුරුදී තිබෙන බවත්, ඒවා ආවර්ජනයකිරීමේදී, මගේ ජීවිතයට මෙන්ම අන් අයගේ ජීවිතවලටද ආශිර්වාද ගෙනදී ඇත. මෙම සියලු වර්ෂවලදී පවත්වාගත්, මගේ දිනපතා ජර්නලය, මා ඉතා කැමති විශේෂිත කිහිපයක් ලබාදීමට උපකාරවතවී ඇති අතර, එසේ නැතිව යළි මතක්කිරීමට නොහැකිවනු ඇත.

1965 වෙනි වසර මුලදී ස්ටේක් සම්මන්ත්‍රනයකට සහභාගිවී දකුණු පැසිෆික් ප්‍රදේශයේ පුරාම වෙනත් රැස්වීම් පැවැත්වීමට මට පැවරුමක් ලැබින. ලෝකයේ එම කොටසට මා ගිය පළමු වතාව එය වූ අතර, එම කාලය කිසිදා අමතකද නොවන්නේය. මෙම පැවරුම අතරතුරදී නායකයන්, සාමාජිකයන් සහ ධර්මදූතයන්  හමුවීම, වැනි සිදුවූ බොහෝ දේවල් ස්වභාවයෙන්ම ආත්මික සිද්ධීන්ය.

සති අන්තයේ සෙනසුරාදා සහ ඉරිදා, පෙබරවාරි 20 සහ 21, දිනවල අපි ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නගරයේ සිටිමින්, බ්‍රිස්බේන් ස්ටේකයේ ක්‍රමානුකූල සම්මන්ත්‍රන සැසිවාර පැවැත්වූවෙමු. සෙනසුරාදා රැස්වීම් කාලයේදී, යාබද පළාතක දිස්ත්‍රික් සභාපතිවරයාට මාව හඳුන්වාදෙන ලදී. මා ඔහුට අතට අත දෙන විට, ඔහු සමග කථාකර, ඔහුට උපදෙස් ලබා දිය යුතු බවට මට තදබල හැඟීමක් ඇතිවිය. එනිසා පසුදා, ඉරුදින උදෑසන සැසියට මා රැගෙන යන ලෙස මම ඔහුට කීවෙමි, එවිට මෙය ඉටුකරගත හැකිවනු ඇත.

ඉරුදින සැසියෙන් පසුව, එකට හමුවීමට අපට අවස්ථාවක් ලැබින, දිස්ත්‍රික් සභාපතිවරයා ලෙස ඔහුගේ වගකීම් බොහොමයක් ගැන අපි කථා කළෙමු. අප එසේ කරන විට, ධර්මදූත කටයුතු ගැන සහ ඔහුගේ ප්‍රදේශයේදී  පූර්ණ-කාලීන ධර්මදූතයන්ගේ කටයුතුවලදී ඔහුට සහ ඔහුගේ සාමාජිකයන්ට උපකාරවත්විය හැකි අන්දම ගැන නිශ්චිත යෝජනා කිහිපයක් කිරීමට මට තදබල හැඟීමක් ඇතිවිය. පසුව මට දැනගන්ට ලැබුන අන්දමට මෙම මිනිසා උපදෙස් පතා යාච්ඤාකර ඇත. අප දෙදෙනාගේ හමුවීම ඔහුගේ යාච්ඤා අසා පිළිතුරුදී ඇති බවට ඔහුට විශේෂ සාක්ෂියක්විය. මෙය පෙනෙන ලෙස විශිෂ්ට රැස්වීමක් නොවුනද, මට ඒත්තු ගිය දෙයක් වුනේ, ආත්මික මගපෙන්වීමක් ලැබීම සහ එය එම දිස්ත්‍රික් සභාපතිවරයාගේ ජීවිතයට සහ පරිපාලනයටත්, ඔහුගේ සාමාජිකයන්ගේ ජීවිතවලටත්, එහි සිටි ධර්මදූතයන්ගේ සාර්ථකත්වයටත් වෙනසක් ඇතිකළ බවය.

මගේ සොයුරු සොයුරියනි, අපි ආත්මික මගපෙන්වීම්වලට ඇහුම්කන් දෙන විට ස්වාමීන්වහන්සේගේ අරමුණු නිතරම ඉෂ්ටවේ. අපට එන පෙළඹවීම් සහ හැඟීම් අනුව අප ක්‍රියාකරන තරමටම ස්වාමීන්වහන්සේ අපට උන්වහන්සේගේ පණිවුඩද වැඩියෙන් පවරන බව මම විශ්වාසකරමි.

කලින් පණිවුඩවලදී මා සඳහන්කර ඇති ලෙස, සහ මා ඉගෙනගත් පරිදි, පෙළඹවීමක් කිසිදා කල් නොතබන්න. වසර ගණනාවකට පෙර, එක් අවස්ථාවකදී, මම සෝල්ට් ලේක් ඩෙසරට් ව්‍යායාම ශාලාවේ සිටියදී විශ්වවිද්‍යාල ආරෝග්‍යශාලාවට ගොස් මගේ මිතුරෙකු හමුවීමට මට පෙළඹවීමක් ඇතිවිය. ඔහුගේ පාදයේ පහළ කොටස අසාධ්‍ය රෝගයක් සහ සැත්කමකින් පසුව ඔහුට අහිමිවිය. මම ඉක්මණින්ම තටාකයෙන් පිටවී, ඇඳුම් ඇඳගෙන, මෙම යහපත් මිනිසාව දැකීම සඳහා ගියෙමි. මා ඔහුගේ කාමරයට ගිය විට එය හිස්ව තිබින, සොයා බැලීමේදී, රෝහලේ නාන තටාකය අසලදී ඔහුව හමුවිය හැකි බැව් මම දැනගත්තෙමි, එය ශාරීරික චිකිත්සක ප්‍රදේශයකි. එම හමුව විශේෂ සිද්ධියකි, ඔහු සිය රෝදපුටුවෙන් එහි පැමිණ තිබූ අතර කාමරයේ සිටි එකම තැනැත්තාද ඔහු විය. ඔහු සිටියේ තටාකයේ ඈත පැත්තක, ගැඹුරු කෙළවරේය. මා ඔහුට කථාකළ අතර, ඔහු  සිය රෝද පුටුව හසුරුවාගෙන මට සුභපැතීය. එය ප්‍රීතිමක් හමුවක් විය. මම ඔහුගේ රෝහල් කාමරයට ඔහු සමග ගොස් ඔහුට ආශිර්වාදයක් දුන්නෙමි.

මගේ මිතුරාගෙන් මට පසුව දැනගැනීමට ලැබුන අන්දමට එදින ඔහු දැඩිලෙස කලකිරී තමාගේ ජීවිතය පවා නැතිකරගැනීමට කල්පනාකරමින් සිට ඇත. ඔහු සහනය පතා යාච්ඤාකර ඇතත්, ඔහුගේ යාච්ඤාවලට පිළිතුරු නොලැබෙන බව ඔහුට හැඟී ඇත. ඔහු  තටාකයට ගියේ ඔහුගේ දුක්ඛිතකම අවසන් කිරීමට මාර්ගය එය යයි සිතමින්ය ඔහු සිය රෝදපුටුව තටාකයේ ගැඹුරුම කෙළවර දෙසට ගෙනගියේය. මා එම අවදානම් අවස්ථාවට පැමිණ තිබුනේ, මා දන්නා පරිදි, ඉහළින් ලැබුණු පෙළඹවීමකට ප්‍රතිචාර දැක්වීම සඳහාය.

මගේ මිතුරාට තවත් වසර ගණනාවක් ජීවත්වීමට හැකිවිය එය ප්‍රීතිය සහ කෘතඥතාවය පිරුණ වසර ගණනාවකි. එම අවදානම් දිනයේ නාන තටාකය අසල ස්වාමීන්වහන්සේගේ හස්තයේ මෙවලමක්වීමට ලැබීම මට කෙතරම් සතුටක්වීද.

තවත් අවස්ථාවකදී, මොන්සන් සොයුරිය සහ මා මිතුරන් බැහැදැකීමෙන් පසුව නිවසට ධාවනයකරන විට, අපි නගරයට යා යුතු බවට මට පෙළඹවීමක් ඇතිවිය සැතපුම් ගණනාවක ධාවනයකි අපගේ කොට්ඨාශයේ කාලයක් ජීවත්වූ මහළු වැන්දඹුවක් හමුවීම සඳහාය. ඇගේ නම සෙලා තෝමස් විය ඒ කාලයේ ඇය සාත්තු නිවාසයක නේවාසිකව සිටියාය. එදින මුල් පසවරු කාලයේ ඇය අතිශයින් බෙලහීනව සිටි නමුත් ඇයගේ යහනේ සමාදානයෙන් වැතිරී සිටියාය.

සෙලා බොහෝ කාලයක් අන්ධව සිටි නමුත්, ඇය අපගේ කටහඬවල් ක්ෂණයකින් හඳුනාගත්තාය. ඇයට ආශිර්වාදයක් දීමට හැකිදැයි ඇය මගෙන් ඇසුවාය, ඇය නැවතත් නිවසට යාම ස්වාමීන්වහන්සේට අවශ්‍ය නම් මියයාමට ඇය සූදානම්බවද කීවාය. එම කාමරයේ මිහිරි ශාන්ත බවක් තිබුන අතර, මැරෙන සුළු ජීවිතයේ ඇයට ඉතිරිව තිබෙන කාලය කෙටි බව අපි හැම දෙනාම දැනසිටියෙමු. මගේ අතින් අල්ලාගත් සෙලා, මා ඇය බැලීමට පැමිණ ඇයට ආශිර්වාදයක් දීම අවශ්‍ය බවට ඉතා උද්‍යෝගයෙන් යාච්ඥාකර ඇත. අපි ඇය බැලීමට ආවේ අපගේ ස්වර්ගික පියාණන්ගෙන් කෙළින්ම ලැබුනු පෙළඹවීමක් අනුව බව මම ඇයට  කීවෙමි. මා ඇයගේ නළල සිපගත්තේ, සමහරවිට ඇයව මෙම මැරෙන සුළු ජීවිතයේදී නැවතත් දැකීමට මට නොලැබෙන බව සිතමින්ය. එය ඔප්පුවිය, පසු දින ඇය මියගියාය. අපගේ මිහිරි සෙලාට යම් සහනයක් සහ සමාදානයක් දීමට හැකිවීම ඇයට සහ මටද ආශිර්වාදයකි.

තවත් කෙනෙකුගේ ජීවිතයට ආශිර්වාදයක් වීමට ලැබීමේ අවස්ථාව නිතරම එන්නේ බලාපොරොත්තු රහිතවය. 1983 84 ශීත ඍතුවේ ඉතාමත්ම ශීතල එක රාත්‍රියක, මොන්සන් සොහොයුරිය සහ මම යුටා මිඩ්වේ කඳුකර මිටියාවතට සැතපුම් කිහිපයක් ධාවනය කළෙමු. අපට එහි නිවසක් ඇත. එදින රාත්‍රී උෂ්ණත්වය ෆැරන්හයිට් අංශක -24ක්විය. සෙලස්සියස් (-31) කි. අපගේ එහි නිවසේ සියල්ල හොඳින් තිබෙන බව සහතිකකරගැනීමට අපට අවශ්‍යවිය. එය හොඳින් තිබෙන බව අපි පරීක්ෂාකර දැනගතිමු. එනිසා අපි සෝල්ට් ලේක් සිටි බලා නැවත යාමට හැරුනෙමු. අපි ඉතා අමාරුවෙන් මහා මාර්ගයේ සැතපුම් කිහිපයක් යන විට අපගේ කාරය ක්‍රියාකිරීම නැවතින. අපි සම්පූර්ණයෙන්ම අතරමං වීමු. එදින රාත්‍රියේ වැනි අධි ශීතලකින් අපි සිට ඇත්තේ කාලාතුරකිනි.

අකමැත්තෙන් වුවද, ළඟම තිබෙන නගරය දෙසට අපි ඇවිද ගියෙමු. කාර් රථ අපව පසුකරගෙන වේගයෙන් යයි. අවසානයේදී එක් කාර් රථයක් නැවතුන අතර තරුණ මිනිසෙක් අපට උපකාර කිරීමට කැමතිවිය. අවසානයේදී අපට දැනගන්ට ලැබුනේ අපගේ ගෑස් ටැංකියේ ඩීසල් ශීතලට මිදී ඇති බවය. එනිසා කාරය ධාවනයකරීමට අපට නොහැකිවිය. එම කාරුණික තරුණයා අපව රැගෙන අපගේ මිඩ්වේ නිවසට ධාවනය කළේය. ඔහුගේ සේවයට මුදල් ගෙවීමට මා උත්සාහ කළද ඔහු එය කාරුණිකව ප්‍රතික්ෂේප කළේය. ඔහු බාලදක්ෂයෙකු බවත් එනිසා යහපත කිරීමට අවශ්‍යවූ බවත් ඔහු පෙන්වා දුන්නේය. මම ඔහුට මාව හඳුන්වා දුන්විට, අපට උපකාරකිරීමට ලැබුන වරප්‍රසාදය ගැන ඔහු කෘතඥතාවය පලකළේය. ඔහු ධර්මදූත වයසේ සිටි නිසා දූතමෙහෙයක් කිරීමට කැමතිදැයි මා ඇසූ විට, ඔහු කළ යුතු දෙය ගැන ඔහුට ස්ථිර නැති බව පෙන්වා දුන්නේය.

ඊළඟ සඳුදින උදෑසන මම මෙම තරුණයාට ලිපියක් ලියා ඔහුගේ කරුණාවන්තකම ගැන ඔහුට ස්තුති කලෙමි.  එම ලිපිය තුලින් පූර්ණ-කාලීන දූතමෙහෙයක් සේවය  කිරීමට මම ඔහුව දිරිමත් කළෙමි. මගේ පොතක් ඊට ඇතුල්කර, දූතමෙහෙය සම්බන්ධ පරිච්ඡේද යටින් ඉරි ගැසීමි.

සතියකට පසුව තරුණයාගේ මව දුරකථනයෙන් කථාකර, ඇගේ පුතා විශිෂ්ට තරුණයෙක් නමුත් ඔහුගේ ජීවිතයේ යම් බලපෑමක් නිසා දූතමෙහෙයක් සේවයකිරීමට දීර්ඝකාලයක් තිබූ ආශාව අඩුවී ඇති බව කීවාය. ඇය සහ ඔහුගේ පියා ඔහුගේ හදවත වෙනස්වීමට උපවාසකරමින් යාච්ඥාකළ බවද පෙන්වා දුන්නාය. ඔවුහු ඔහුගේ නම ප්‍රෝවෝ යුටා දේවමාළිගාවේ යාච්ඥා ලැයිස්තුවේ ඇතුල්කර ඇත. ඔවුන්ගේ බලාපොරොත්තුව, කෙසේ හෝ, යම් ආකාරයකින්, ඔහුගේ හදවත යහපතට ස්පර්ශවී, දූතමෙහෙයක් කිරීමට සහ ස්වාමීන්වහන්සේට සේවයකිරීමට ඔහුට ආශාව ඇතිවීමය. එදා ශීතල රාත්‍රියේ  සිදුවීම ඔහු වෙනුවෙන් කල ඇගේ යාච්ඥාවට පිළිතුරක් බව මා දැනගැනීම ඇයට අවශ්‍යවිය. "මම ඔබ සමග එකඟයි" මම කීවෙමි.

මාස කිහිපයකට සහ මෙම තරුණයා සමග කල බොහෝ සංවාදවලින් පසුව, ඔහු සිය කැනඩා

වැන්කුවෙයර් දූතමෙහෙයට පිටව යාමට පෙර සමුගැනීමට සහභාගිවීමෙන් මම සහ මොන්සන් සොයුරිය ඉතා සතුටුවුනෙමු.

එය එම ශීතල දෙසැම්බර් රාත්‍රියේ අපගේ මාවතට අවතීර්ණවූ එක් අවස්ථාවක්ද? මම එක මොහොතකට වත් එය විශ්වාසනොකරමි. මා විශ්වාසකරන්නේ අපගේ හමුවීම මවගේ සහ පියාගේ ඔවුන්ගේ ආදර පුතා වෙනුවෙන් හෘදයාංගම යාච්ඤාවට ලැබුණු පිළිතුරක් බවය

නැවතත්, මගේ සොයුරු සොයුරියනි, අපගේ අවශ්‍යතාවයන් ගැන අපගේ ස්වර්ගික පියාණන් දැනසිටිමින් අපි උන්වහන්සේගෙන් සහයෝගය ඉල්ලන විට අපට උපකාරකරනසේක. මා විශ්වාසකරන්නේ අපගේ වුවමනාවන් කිසිවක් කුඩා වැඩි හෝ නොවැදගත් හෝ නෙවන බවය.

සියවාරයක් බලපෑමක් ඇතිකල මෑතකදී ලැබූ අත්දැකීමක් බෙදාගෙන අවසන්කිරීමට මම කැමැත්තෙමි. එය සිදුවූයේ මාස පහකට පෙර, කැන්සාස් සිටි දේවමාළිගාවේ සංස්කාතික උත්සවයකදීය. අපගේ ජීවිතවල සිදුවන බොහෝ සිදුවීම් මෙන්, එම වෙලාවේ එය පෙනුනේ තවත් අත්දැකීමක් ලෙසය. හැම දෙයක්ම ක්‍රියාත්මක විය. කෙසේවවද, සංස්කෘතික උත්සවය සම්බන්ධ අවස්ථාවලින් මා දැනගත් පරිදි දේවමාළිගාව කැපකිරීමට පෙරදා සවස, එම රාත්‍රියේ දර්ශනය සාමාන්‍ය දෙයක් නොවන බවය. ඒ වෙනුවට එය විශිෂ්ට දෙයකි.

දේවමාලිගා කැපකිරීම් සමග සම්බන්ධිත සියලු සංස්කෘතික දර්ශන මෙන්, මිසූරි, කැන්සාස් සිටි දේවමාලිගා දිස්ත්‍රික්කයේ තරුණ අය ඔවුන්ගේ ප්‍රදේශවලඋ වෙනම කණ්ඩායම් ලෙස සංදර්ශනය පුහුණුවූහ. සැලසුම වුනේ ඔවුන් සියලුදෙනාම නගර ශාලාවේ කුලියට ගත් විශාල මධ්‍යස්ථානයක සෙනසුරාදා උදෑසන හමුවීමටය. එවිට කොහොම කෙලෙස ඇතුල්වන්නේද, ඔවුන් සිටින්නේ කොහේද, ඔවුන් සහ ඔවුන් ළඟ සිටින පුද්ගලයා අතර කෙතරම් ඉඩ ප්‍රමාණයක් තිබේද, ප්‍රධාන ශාලාවෙන් පිටවන්නේ කෙසේද, යනාදියයි. අණ දෙන්නා විවිධ දර්ශන එකට දමා තිබුන නිසා දවස තුලදී බොහෝ තොරතුරු දැනගත යුතුව තිබින. එවිට අවසාන දර්ශනය හොඳින් සහ වෘත්තීමය ලෙස තිබෙනු ඇත.

එදින බරපතල ප්‍රශ්නයක් තිබින. මුළු නිෂ්පාදනයම කලින් පටිගතකළ කොටස්වලින් සමන්විතවූ අතර, ඒවා ජම්බෝට්‍රොන් නම් විශාල තිරයක පෙන්වනු ලැබේ මෙම කලින් පටිගත කිරීම් මුළු නිෂ්පාදනයටම ඉතා වැදගත්විය. ඒවා සියල්ලම සමග එකට බැඳී තිබුනා පමණක් නොව, විකාශනය කෙරෙන හැම කොටසක්ම, ඊළඟ කොටස ගැන හැඳින්වීමක්ද දෙනු ඇත. වීඩියෝ කොටස් රාමුවක් සපයන අතර, ඒ මත මුළු නිෂ්පාදනයම බලාපොරොත්තු තබා ඇත. තවද ජම්බෝට්‍රොන් එක ක්‍රියාත්මක නොවීය.

කාර්මික ශිල්පීන් ප්‍රශ්නය විසඳීමට පෙරහුරුවද නැතිකරගනිමින්, එහි සිටි, දහස්ගණන් තරුණ අය සමග යුහුසුලුව ක්‍රියාත්මකවූහ. එහි තත්වය අසීරුබව පෙනීමට පටන්ගත්තේය.

සංදර්ශනයේ රචකයා සහ අධ්‍යක්ෂක සුසාන් කූපර් පසුව පැහැදිළිකරමින්ඃ අපි සැලසුම ඒ සිට ඉසෙඩ් දක්වා ගෙනයන විට, එය ක්‍රියාත්මක නොවන බව අපි දැනගත්තෙමු. අපි කාල සටහන දෙස බැලූවිට, එය අපට එහායින් බව අපි දැනගත්තෙමු. නමුත් පහළ පොළොව මත අපට විශාලතම ශක්තියක් තරුණ අය 3,000ක් සිටි බව අපි දැනසිටියෙමු. පහළට ගොස් සිදුවන දේ කියා ඔවුන්ගේ ඇදහිල්ල ක්‍රියාත්මක කිරීමට අපට අවශ්‍යව තිබුනි. [3]

පැයකට කලින් ප්‍රේක්ෂකයන් පැමිණීමට පටන්ගනු ඇත. තරුණ අය 3000ක් පොළොව මත දණගසා එකට යාච්ඤා කළහ. ඔවුන් යාච්ඤා කලේ ජම්බ්‍රෝට්‍රොන් එකේ වැඩකරන අයට එය අළුත්වැඩියාකිරීමට කුමක් කළ යුතුද කියා පෙළඹවීමටය; ඔවුන් සිය ස්වර්ගික පියාණන්ගෙන් විමසුවේ, ඔවුන්ට කාලය මදි නිසා කළ නොහැකිවූ දෙය කිරීමට ඔවුන්ට උදව්කරන ලෙසය.

ඒ ගැන පසුව ලියූ කෙනෙක් මෙසේ කීවේය, එය තරුණ අය කිසිදා අමතක නොකරන යාච්ඥාවකි, පොළොව තද නිසා නොව, ආත්මයාණන් ඔවුන්ගේ කටු මොලොක්කළ නිසාය. [4]

කල් නොයාම එක් කාර්මික ශිල්පියෙක් පැමිණ දෝෂය සොයා නිවැරදිකළ බව කීවේය. ඔහු විසඳුමට වාසනාව කියා ගුණවාචකයක් එකතු කළ, නමුත් එහි සිටි සියලු තරුණ අය ඒ ගැන හොඳින් දැනසිටියහ.

එදින අපි නගරශාලා මධ්‍යස්ථානයට ඇතුල්වූ විට, එදින තිබූ අසීරුකම් ගැන අප නොදැන සිටියෙමු. අපි ඔවුන්ගෙන් දැනගත්තේ පසුවය. කෙසේවුවද, අපි දුටු දෙය, අලංකාර සහ ඔපදැමූ සංදර්ශනයකි මා දුටු හොඳම එකකි. තරුණ අය මහීමාන්විත බලවත් ආකල්පයක් ප්‍රසාරණයකළ අතර, එහි සිටි හැම දෙනාටම එය හැඟුනි. ඇතුල්වෙන්නේ කොහෙන්ද, සිටින්නේ කොහේද, ඔවුන් වටා සිටි සියලුම රඟදක්වන්නන් ගේ අන්‍යොන්‍ය සම්බන්ධතාවය තබාගන්නේ කෙසේද කියා ඔවුන් දැනසිටි බව පෙනේ. ඔවුන්ගේ පෙරහුරු කෙටිකළ බව සහ මුළු කණ්ඩායමෙන් බොහෝ සංඛ්‍යාවක් පෙරහුරු නොකළ බව මා දැනගත් විට, මම පුදුමවුනෙමි. කිසිවෙක් දැනසිටියේ නැත, ඇත්තවශයෙන්ම වෙනස ඇති කලේ ස්වාමීන්වහන්සේය.

ස්වාමීන්වහන්සේ සිය රාජධානියේ දිග සහ පළල මෙහයවා පොළොඹවන්නේ කෙසේදැයි මවිතවීම මම කිසිදා නතර නොකරන්නෙමි. එහෙත් එක් එක් පුද්ගලයා හෝ එක සංස්කෘතික සංදර්ශනයක් හෝ එක ජම්බෝරොන් එකක් සම්බන්ධව පෙළඹවීම් කිරීමටද උන්වහන්සේට කාලය ඇත. සත්‍යය නම් උන්වහන්සේට පුළුවන, උන්වහන්සේ එය කරනසේක, එය මට සාක්ෂියකි.

මගේ සොයුරු සොයුරියනි, ස්වාමීන්වහන්සේ අප සියලුදෙනාගේම ජීවිතවල සිටිනසේක. උන්වහන්සේ අපට ප්‍රේමකරසේක. අපට ආශිර්වාදකිරීමට, අපි උන්වහන්සේගේ උපකාර සෙවීම, උන්වහන්සේට අවශ්‍යවනසේක. උන්වහන්සේ අපගේ ආශාවන්ට අනුව, අපට මග පෙන්වා, අපව මෙහෙයවා සහ අපගේ යාච්ඥා අසා අපට පිළිතුරු දෙනවිට අපට දැන් මෙහිදී සතුට ලැබෙන්නේය .අපගේ ජීවිතවලට ලැබෙන උන්වහන්සේගේ ආශිර්වාද අපට දැනේවා යයි මා යාච්ඥාකරන්නේ යේසුස් ක්‍රිස්තුවහන්සේ, අපගේ ගැලවුම්කරුවාණන්ගේ නාමයෙනි, ආමෙන්.

සටහන්

1. 2 නෙපී 2:25.

2. දහම සහ ගිවිසුම 112:10.

3. Susan Cooper Maurine Proctor, Nothing s Too Hard for the Lord: The Kansas City Cultural Celebration, *Meridian Magazine*, මැයි 9, 2012 ldsmag.com.

4. Proctor, *Meridian Magazine,* මැයි 9, 2012.

# පළවෙනි සභාපතිත්වයේ සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ 2012

## කණගාටුවීම් සහ අධිෂ්ඨාන

**සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ් විසිනි**

**පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා**

ශුද්ධත්වය සහ සතුට හඹායාම සඳහා අපගේ කැපවීම වැඩිවන තරමටම, අපට කණගාටුවීමට සිදුවන්නේද අඩුවෙනි.

කණගාටුවීම්

මොන්සන් සභාපතිතුමනි, අපි ඔබට ප්‍රේමකරමු. අළුත් දේවමාලිගා ගොඩනැගීම සහ ධර්මදූත සේවා ගැන කළ ආනුභාමත් සහ ඓතිහාසික නිවේදන ගැන ඔබට ස්තුතියි. ඒවා නිසා, අපට සහ බොහෝ අනාගත පරම්පරාවලට විශාල ආශිර්වාද ලැබෙන බව මට සහතිකය.

මා ආදර සොයුරු සොයුරියනි, මා ප්‍රිය මිතුරනි! අප සියල්ලෝම මිනිසුන්ය. මෙය කිසිවෙකුට විස්මිත දෙයක් නොවන බව මගේ විශ්වාසයයි.

අප කිසිවෙක් පොළොව මත බොහෝ කාලයක් සිටින්නේ නැත. අප ඉදිරියේ තිබෙන බොහෝ අගනා කාලය, එම සදාකාලික දර්ශනය හමුවේ ඇසි පිය හෙළන කාලයකි.

තවද ඉන්පසුව අපි පිටව යන්නෙමු. "අපගේ ආත්මය [අපට] ජීවය දුන් එම දෙවියන්වහන්සේගේ නිවසට රැගෙන යන්නේය."1 මතු ලෝකයේ අපගේ පැවැත්ම සඳහා අපි අපගේ ශරීර සහ මෙම ලෝකයේ දේවල් දමා යන්නෙමු.

අපගේ තරුණ කාලයේදී අප සදා ජීවත්වන බවක් අපට පෙනින. ක්ෂිතිජයට එහායින් අසීමිත හිරුඑළියක් තිබෙන බව අපි සිතන අතර, අනාගතය අපට පෙනෙන්නේ අප ඉදිරියේ දිගහැරී තිබෙන නිමක් නොවන නොකැඩුන මාර්ගයක් ලෙසය.

කෙසේවුවද, අප වයසට යන විට, අපි වඩා වඩාත් ආපසු බැලීමට යොමුවී, මාර්ගය සැබවින්ම කෙතරම් කෙටිදැයි පුදුම වන්නෙමු. එතරම් ඉක්මනින් කාලය ගතවුයේ කෙසේදැයි අපි කල්පනාකරන්නෙමු. එසේම අප කළ තේරීම් සහ අප කළ දේවල් ගැන සිතීමට අපි පටන්ගන්නෙමු. එම ක්‍රියාවලියේදී අපගේ ආත්මය සැනසූ සහ අපගේ හදවත් ප්‍රීතිමත්කළ නොයෙක් අසිරිමත් අවස්ථාවන් ගැන අපට මතක ඇත. නමුත් අප කණගාටුවූ අවස්ථාද අපට මතක්වේ—නැවත ගොස් ඒවා වෙනස්කිරීමට පවා අපට සිතෙන්නේය.

මාරාන්තිකව රෝගීව සිටින අය රැකබලාගන්නා හෙදියක් පවසන්නේ මෙම දිවියෙන් සමුගැනීමට සූදානම්වන ලෙඩුන්ගෙන් ඇය නිතරම සරල ප්‍රශ්නයක් අසන බවය.

ඔබට යම්කිසි දෙයක් ගැන කණගාටුවක් තිබේද? 2

මැරෙන සුළු ජීවිතයේ එම අවසාන දිනය සමීපවන විට නිතරම පැහැදිළි සිතිවිලි ඇතිවී බුද්ධිය සහ අනාගත දැක්මක්ද ලබාදෙයි. එනිසා මෙම මිනිසුන්ගෙන් කණගාටුවන දේවල් ගැන ඇසූවිට, ඔවුහු සිය හදවත් විවරකරති. ඔවුන්ගේ සිත යොමුවන්නේ ඔවුන් වෙනස්කළ යුතු දේවල් ගැනය, එහෙත් ඔරලෝසුව ආපසු කැරකීමට ඔවුන්ට හැකිනම් පමණි.

ඔවුන් කියා තිබෙන දේවල් ගැන මා සලකාබලන විට, අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියේ මූලික මූලධර්ම, අප අදාලකරගන්නේ නම් පමණක්, ඒවා අපගේ ජීවන ගමනේ යහපත සඳහා කෙසේ බලපාන්නේදැයි මට සිතේ,

සුභාරංචියේ මූලධර්මවල අභිරහස් කිසිවක් නැත. අපි ඒවා ශුද්ධලියවිලිවල අධ්‍යයනය කර ඇත. අපි ඒවා ඉරුදින පාසලේ සාකච්ඡාකර ඇත. නොයෙක් අවස්ථාවල ඒවා දේවාසනයෙන් අපි අසා ඇත්තෙමු. මෙම දිව්‍යමය මූලධර්ම සහ ගුණධර්ම ඍජු සහ පැහැදිළි ඒවාය. ඒවා අලංකාරය, ගැඹුරු, සහ බලවත්ය; තවද අනාගත කණගාටුවීම්වලින් වැළකීමට අපට උදව්වීමට ඒවාට ස්ථිරවම පුළුවන.

මා ප්‍රේමකරන ජනතාව සමග වැඩිකාලයක් ගතකර තිබුනේ යයි මම සිතමි.

සමහරවිට මරණාසන්න ලෙඩුන් ප්‍රකාශකළ ඉතාමත්ම විශ්ව කණගාටුවක් නම්, ඔවන් ප්‍රේමකළ අය සමග වැඩිපුර කාලයක් ගතකිරීමට ඔවුන් තුල තිබූ ආශාවය.

සුවිශේෂිත මිනිස්සු මෙම විශ්ව ශෝකගීතය ගායනා කළහ. ඔවුහු "ඔවුන්ගේ කාලයෙන් වැඩිකොටසක් දිනපතා වැඩකිරීම සඳහා වැයකිරීම ගැන දැඩිලෙස … කණගාටුවූහ."3 පවුලේ අය හා මිතුරන් සමග කාලය ගතකිරීමෙන් ලැබෙන ප්‍රියජනක මතකයන් බොහෝ දෙනෙකුට අමතකව ගොස්ය. ඔවුන්ට බොහෝ වැදගත්වූ අය සමග දැඩි සම්බන්ධතාවයක් ගොඩනගාගැනීමේ අවස්ථා ඔවුන්ට අහිමිවී ඇත.

අපි නිතරම කාර්‍යබහුල වීම අසත්‍යයක්ද? එසේම, අපි අපගේ කාර්යබහුලබව ගෞරවයේ පදක්කමක් ලෙස

පළඳින බව කීමට පවා කණසාටුවකි. කාර්‍යබහුලවී සිටීම, යමක් ඉටුකරගැනීමක්ද, නැතහොත් උසස් ජීවිතයක ලක්ෂණයක්ද.

එය එසේද?

අපගේ ස්වාමීන්වහන්සේ සහ ආදර්ශකයාණන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ජනතාව අතර ගතකළ උන්වහන්සේගේ කෙටි ජීවිතකාලය ගැන මම සිතමි. උන්වහන්සේ කලබලයෙන් රැස්වීම් පැවැත්වීම හෝ හදිසිවැඩ රාශියක් ඉටුකරගැනීමට කටයුතුකිරීම ගැන සිතාබැලීමට මම උත්සාහකර ඇත්තෙමි.

මට එය පෙනෙන්නේ නැත.

ඒ වෙනුවට දෙවියන්වහන්සේගේ සානුකම්පිත සහ සැලකිලිමත් පුත්‍රයාණෝ අරමුණක් සහිතව හැම දිනකම ජීවත්වනසේක. තමන්වහන්සේ වටා සිටින අය ගැන උන්වහන්සේ සැලකිලිමත්වන විට, වැදගත්කම සහ ප්‍රේමකිරීම ගැන ඔවුන්ට හැඟේ. උන්වහන්සේට හමුවූ ජනතාවගේ අසීමිත වටිනාකම උන්වහන්සේ දැනසිටිසේක. උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාදකර, සේවයකළසේක. උන්වහන්සේ ඔවුන්ව ඔසවා තැබූසේක. ඔවුන්ව සුවකළසේක. උන්වහන්සේගේ වටිනා කාලය නම් උමනාව උන්වහන්සේ ඔවුන්ට දුන්සේක.

අන් අය හා කාලයගතකරන බව බොරුවට ඇඟවීම අපේ කාලයේ ඉතා පහසු දෙයකි. මවුස්එක වරක් එබීමෙන් කිසිදා හමුනොවුන දහස් ගණන් "මිතුරන්" හා "සම්බන්ධවීමට" අපට හැකිය. තාක්ෂණය අසිරිමත් දෙයක් වන අතර, අප ආදරය කරන අයට සමීපවීමට අපට නොහැකිවන විට එය ඉතා ප්‍රයෝජනවත් විය හැකිය. මගේ බිරිඳ සහ මම ජීවත්වන්නේ අපගේ මාහැඟි පවුල් සාමාජිකයන්ගෙන් ඉතා ඈතකය; එය කෙසේදැයි අපි දන්නෙමු. කෙසේවෙතත්, මා විශ්වාසකරන්නේ අපි, නොවැදගත් දේවල් ඉදිරිපත්කරමින්, හෝ අන්තර්ජාලය ඔස්සේ අප ආදරයකරන අය හා සම්බන්ධවීම මගින් පුද්ගලිකව සහ සාමාජීය ලෙස, හරි මාර්ගයට අවතීර්ණවී නොමැතිබවය. මේ අන්දමේ ක්‍රියාවන් සඳහා ස්ථානයක්  තිබෙන බව මා සිතන නමුත්, ඒ සඳහා කොපමණ කාලයක් ගතකිරීමට අප කැමතිවන්නේද? අපට සැබවින්ම වැදගත්වන අය වෙනුවෙන් පුද්ගලිකව සහ අපගේ හොඳම කාලය වැයකිරීමට අප අසමත්වීමෙන්, යම්දිනෙක අපි ඒ ගැන කණගාටු වන්නෙමු.

අප ආදරයකරන අය සමග අර්ථවත් ලෙස කාලයගතකරමින්, එක්ව කටයුතුකර, අගනා මතකයන් ඇතිකරගෙන, ඔවුන්ව රැකබලාගැනීමට අපි අධිෂ්ඨාන කරමු.

මගේ හැකියාවන් අනුව මා ජීවත්වූ බව මම සිතමි

මිනිසුන් කණගාටුව පළකරන තවත් දෙයක් නම් තමා කවුරුන් විය යුතුදැයි සිතුන පුද්ගලයා වීමට ඔවුන්ට නොහැකිවීම ගැනය. ඔවුන් සිය ජීවිත දෙස ආපසු හැරී බලන විට, ඔවුන්ගේ හැකියාවන් අනුව ජීවත් නොවුන බවත්, ගායනා නොකළ ගීත බොහොමයක් තිබෙන බවත් ඔවුහු අවබෝධකරගනිති.

අපගේ විවිධ තත්වයන්වල සාර්ථක්වයේ ඉණිමං නැගීමක් ගැන මම මෙහිදී කථා නොකරමි. එම ඉණිමග මෙම පොළොව මත කෙතරම් උසස් ලෙස පෙනුනද, අප ඉදිරියේ තිබෙන සදාකාලික ශ්‍රේෂ්ඨ ගමනේ එය එක් පියවරක් පමණි.

ඒ වෙනුවට මා කථාකරන්නේ දෙව්වූ අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ, සිතන පුද්ගලයෙකු බවට අප පත්වීම ගැනය.

මෙම ලෝකයට අප පැමිණියේ, කවියෙක් කියා තිබෙන ලෙස,  මැරෙනසුළු ජිවිතයට පෙර ලෝකයේ "මහිමයේ වළාකුළු දවටාගෙනය."4

අපගේ සැබෑ හැකියාවන් ගැන අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ දන්නාසේක. අපි අප ගැන

දන්නවාට වඩා දේවල් උන්වහන්සේ අප ගැන දන්නාසේක. අපගේ ජීවිත කාලය තුළදී අපගේ මැවීමේ ප්‍රමාණය සම්පූර්ණකිරීමට උන්වහන්සේ අප පොලොඹවනසේක.

එසේනම්, අපගේ කාලය සහ ශක්තිය විශාල ප්‍රමාණයක් එතරම් අස්ථිර, වැදගැම්මකට නැති, එතරම් හරයක් නැති දේවලට කැපකරන්නේ මන්ද? නොවැදගත් සහ නිත්‍යනොවන දේ හඹායාමේ මෝඩකම දැකීම අපි ප්‍රතික්ෂේප කරන්නේද?

අපට මෙය ඥානාන්විත නොවන්නේද "ස්වර්ගයේ [අපට] වස්තු රැස්කර තබාගැනීමෙන්, එහිදී කාවෝද මලකඩද ඒවා නාස්තිකරන්නේවත්, සොරුද උමං කැන සොරාගන්නේවත් නැත"?5

අප මෙය කරන්නේ කෙසේද? ගැලවුම්කරුවාණන්ගේ ආදර්ශය අනුව යාමෙනි, උන්වහන්සේගේ ඉගැන්වීම් අපගේ දිනපතා ජීවිතයට ඇතුල්කරගැනීමෙනි, දෙවියන්වහන්සේට සහ අපගේ සහෝදර ජනතාවට අවංකවම ප්‍රේමකිරීමෙනි.

අපගේ-පාද-ඇදගෙන යමින්, අපගේ ඔරලෝසුව-දෙස-බැලීමෙන්, චෝදනාකරමින් ගෝලයන් වෙතට අප-යන-විට සත්‍යලෙසම අපට මෙය කළ නොහැකිය.

සුභාරංචිය අනුව ජීවත්වීමට සිදුවන විට, අපි පා ඇඟිලි වතුරේ ගිල්වා ගෙන පිහිනීමට ගිය බව කියන ළමයෙකු නොවිය යුතුය. අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ පුතුන් සහ දියණියන් ලෙස, අපට ඊටත් වඩා හැකියාවක් තිබිය යුතුය. ඒ සඳහා යහපත් අදහස් ප්‍රමාණවත් නොවේ. අප *කළ* යුතුය. වඩාත් වැදගත්වන්නේ අප ස්වර්ගික පියාණන්වහන්සේට අවශ්‍ය අය බවට *පත්වීමය.*

සුභාරංචිය ගැන අපගේ සාක්ෂිය ප්‍රකාශකිරීම හොඳය, නමුත් නැවත පිහිටුවූ සුභාරංචිය අනුව ජීවත්වන ආදර්ශයක්වීම වඩා හොඳය. අපගේ ගිවිසුම්වලට ඇදහිලිමත්වීමට ආශාව තිබීම හොඳය; පූජනීය ගිවිසුම්වලට සැබවින්ම ඇදහිලිමත්වීම—ගුණගරුක ජීවිතයක් ජීවත්වීම ඇතුළුව, අපගේ දසයෙන් කොටස සහ පිදුම් ගෙවීම, ප්‍රඥාවේ වචනය ආරක්ෂාකිරීම සහ අවශ්‍ය අයට සේවයකිරීම—වඩාත් හොඳය. පවුලේ යාච්ඤාවට, ශුද්ධ ලියවිලි අධ්‍යයනයකිරීමට, පවුලේ ක්‍රියාකාරකම්වලට වැඩි කාලයක් කැපකිරීම හොඳය; නමුත් සත්‍යලෙසම මේ සියලුම දේවල් නොසැලී කිරීමෙන් අපගේ ජීවිතවලට ස්වර්ගීය ආශිර්වාද රැගෙනඑයි.

ගෝලකම යනු ශුද්ධවන්තකම සහ සතුට හඹායාමය. වඩා හොඳ සහ ප්‍රීතිමත් පුද්ගලයාගේ මාර්ගය එයයි.

ගැලවුම්කරුවාණන්ව අනුගමනයකරමින් උද්‍යෝගයෙන් වැඩකිරීමට අධිෂ්ඨානකිරීමෙන් අප සැලසුම්කළ පුද්ගලයා බවට පත්වීමට අපට පුළුවන. අපි ශුද්ධාත්මයාණන්වහන්සේගේ පෙළඹවීම්වලට සවන්දෙමින් කීකරුවෙමු. අප එසේකරන විට, අප ගැන අපි කිසිදා නොදැන සිටි දේවල් ස්වර්ගික පියාණන්වහන්සේ අපට එළිදරව්කරනසේක. උන්වහන්සේ අප ඉදිරියේ මාවත ආලෝකමත්කරමින්, අප නොදැන සිටි සහ නොසිතූ දක්ෂතා දැකීමට අපේ ඇස් උන්වහන්සේ විවෘතකරනසේක.

අපි ශුද්ධවන්තකම සහ සතුට හඹායාමට අපව වැඩිපුර කැපකරන තරමටම, අපි කණගාටුවීමේ මාවතේ අඩුවෙන් සිටින්නෙමු. අපි ගැලවුම්කරුවාණන්ගේ කරුණාව මත වැඩියෙන් විශ්වාසය තබන තරමටම, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ අදහස්කරන මාර්ගයේ අප සිටින බව අපට වැඩියෙන් හැඟෙන්නේය.

මා මාව සතුටින් තැබීමට ඉඩදුන්බව මම සිතමි

තවත් කණගාටුවක් වන තමන් මියයමින් සිටින බව දැන සිටීම යම් ආකාර පුදුමයක්විය හැකිය. ඔවුන්ගේ ආශාව ඔවුන් විසින් ඔවුන්ව සතුටින් තැබූ බවය.

අපට සතුට ලබාදෙන යමක් අපට ලඟාවිය නොහැකි තැනක තබෙන බවේ මායාවකින් අපි නිතරම රැවටෙන්නෙමු: වඩා හොඳ පවුල් තත්වයක්, වඩා හොඳ මල්‍යමය තත්වයක්, හෝ අභියෝගාත්මක පරීක්ෂාවන්වල අවසානය ඒවාවේ.

අප වයසට යන තරමටම, අපි වැඩියෙන් ආපසු හැරී බලා, බාහිර සිද්ධීන් අපගේ සතුටට සැබවින්ම හේතුවීමක් හෝ නිශ්චයකිරීමක් හෝ නොකරන බව අපි අවබෝධකරගන්නෙමු.

*අපි* හේතුවක් වන්නෙමු. අපගේ සතුට *අපි* නිශ්චයකරන්නෙමු.

ඔබ සහ මම අවසානයේදී අපගේ සතුටේ ප්‍රධානීන් වන්නෙමු.

මගේ බිරිඳ, හැරියට්, සහ මම අපගේ බයිසිකල් පැදීමට කැමැත්තෙමු. එළියට ගොස් ස්වභාව ධර්මයේ අලංකාරය භුක්තිවිඳීම අපූරුය. අපි බයිසිකල් පැදීමට කැමති මාර්ග අපට ඇත. නමුත් අනෙක් ධාවකයන් හා සංසංදනය කරමින් අපි යන දුර ගැන හෝ යන වේගය ගැන අපි වැඩි අවධානයක්

යොමු නොකරන්නෙමු.

කෙසේවුවද, විටින්විට මා සිතන්නේ, අපි මදක් වැඩියෙන් තරඟකාරීවිය යුතු බවය. අපි මදක් වැඩියෙන් ඉදිරියට යන්නේ නම්, අපට වඩා හොඳ කාලයක් හෝ වැඩි වේගයක් ගත හැකි බව මම සිතමි. තවද එවිට මෙම අදහස මගේ යහපත් බිරිඳට කීමෙන් සමහරවිට මා විශාල වරදක්ද කරන්නෙමි.

මේ අන්දමේ මගේ යෝජනාවලට ඇය නිතරම ප්‍රතික්‍රියා දක්වන්නේ ඉතා කාරුණිකව, ඉතා පැහැදිළිව, සහ ඉතා සෘජුවය. ඇය සිනාසෙමින් මෙසේ කියයි, "ඩීටර්, එය තරඟයක් නොවේ; එය ගමනක්. ඒ මොහොතේ විනෝදවන්න."

ඇය කෙතරම් නිවැරදිද!

ජීවිතයේ සමහර අවස්ථාවලදී අපි තරඟ නිමා රේඛාව ගැන සිත යොමුකිරීම නිසා ගමනේ ප්‍රීතිය විඳීමට අපි අසමත් වන්නෙමු. මම බිරිඳ සමග බයිසිකල් තරඟ වලට අකමැති නිමකිරීම පිළිබඳ මා තුල ඇති චකිතය නසාය. මා යන්නේ ඇය සමග සිටීම මිහිරි විනෝදයක් ගෙනදෙන නිසාය.

අපි නිතරම බලාපොරොත්තුව සිටින්නේ එය නිමාවන මොහොත නිසා අප විඳින මිහිරි ප්‍රීතිමත් අත්දැකීම් නාස්තිකිරීම මෝඩකමක් බව නොපෙනේද?

අප අලංකාර සංගීතයට සවන්දෙමින් එහි රසය අවංකව භුක්තිවිඳීමට පෙර එහි අවසන් වචන මැකී යන තුරු සිටින්නේද? නැත. අපි සවන්දෙමින් විවිධ තාල, රිද්මය සහ සංගීතයට අවසානය දක්වා සම්බන්ධවී සිටින්නෙමු.

අපි යාච්ඤාකරන විට අපේ මනසේ තිබෙන්නේ "ආමෙන්" හෝ අවසානකිරීම පමණක්ද? ඇත්තවශයෙන්ම නැත. අපි යාච්ඤාකරන්නේ ස්වර්ගික පියාණන්ට සමීපවීමටය, උන්වහන්සේගේ ආත්මයාණන් ලබාගැනීමට සහ උන්වහන්සේගේ ප්‍රේමය අත්විඳීමටය.

අපි සතුට ලැබීම සඳහා යම්කිසි අනාගත සංධිස්ථානයකට ලංවන තුරු බලා නොසිටිය යුතුය. සතුට හැම අවස්ථාවකම—නිතරම තිබූ බව අපි සොයාගන්නෙමු! ජීවිතය යනු අතීතය ගැන බලා එය අගයකිරීම පමණක් නොවේ. "ස්වාමීන්වහන්සේ සෑදූ දවස මෙයය ...," "ගීතිකාකරුවෙක් මෙසේ ලීවීය, ඒ ගැන ප්‍රිතිවී සංතෝෂවන්න."6

සොයුරු සොයුරියනි, අප කුමන තත්වයක සිටියද, අපගේ අභියෝග හෝ පරීක්ෂාවන් කුමක්වුවද, හැම දිනකම වැළඳගෙන රැකගැනීමට යම් දෙයක් ඇත. අප හැම දිනකම බලා අගයකරන්නේ නම් පමණක්, කෘතඥතාවය සහ ප්‍රීතිය ගෙන එන යම් දෙයක් ඇත.

සමහරවිට අපි අපගේ ඇස්වලින් අඩුවෙන් සහ හදවත්වලින් වැඩියෙන් බලන්නෙමු. මෙම උපුටාගැනීම මම ප්‍රියකරමි: " යමෙක් පැහැදිළිව දකින්නේ හදවතින් පමණකි. අත්‍යාවශ්‍ය කිසිවක් ඇස්වලට පෙනෙන්නේ නැත.."7

"සියල්ලේදීම ස්තුති දීමට"8 අපට නියෝගකර ඇත. එනිසා අපට අපගේ වර්තමාන තත්වය ගැන අසුභවාදී වීම වෙනුවට, ස්තුතිදීමට *හැකි* කුඩා දේවල් පවා අපගේ ඇස්වලින් සහ හදවත්වලින් බැලීම වඩා හොඳ නොවන්නේද?

ස්වාමීන්වහන්සේ මෙසේ පොරොන්දුවී ඇතිසේක, සෑම දෙයක්ම ස්තුති දෙමින් ලබාගන්නා තැනැත්තා, මහිමයට පත්කරනු ලැබ; පොළොව මත සියලුම දේවල් ඔහුට, සිය ගුණයකින් වුවත්, එකතුකරනු ලබන්නේය."9

සොයුරු සොයුරියනි, අපගේ ස්වර්ගික පියාණන්ගේ විශාල ආශිර්වාද සමග, උන්වහන්සේගේ නිර්ලෝභී ගැලවීමේ සැලසුම, නැවත පිහිටුවූ සුභාරංචියේ දිව්‍යමය සත්‍යයන්, සහ මෙම මැරෙනසුළු ජීවිතයේ නොයෙක් අලංකාරයන්ගෙන් "ප්‍රීතිවීමට අපට කාරණාවක් නොවන්නේද."10

අපි අපගේ තත්වයන් නොසලකා සතුටින් සිටීමට අධිෂ්ඨා කගරගනිමු.

අධිෂ්ඨාන

යම් දිනෙක අපි එම වැළැක්විය නොහැකි පියවර ගෙන, මෙම මැරෙන සුළු ලෝකයෙන් ඊළඟ තත්වයට තරණය කරන්නෙමු. යම් දිනෙක අපි අපේ ජීවිත දෙස හැරී බලා අපි වඩාත් හොඳවී, වඩා හොඳ තීරණ ගැනීම, හෝ අපගේ කාලය වඩාත් ඥානවන්තව පාවිච්චි කලේ නම් හොඳ යයි සිතනු ඇත.

ජීවිතයේ දැඩිසේ කණගාටුවීම් සමහරක් වැළැක්වීම සඳහා, යම් අධිෂ්ඨාන අදම ඇතිකරගැනීම ප්‍රඥාගෝචරය. එනිසා අපි:

අප ප්‍රේමකරන අය සමග වැඩිවෙලාවක් ගතකිරීමට අධිෂ්ඨාන කරමු.

දෙවියන්වහන්සේට අවශ්‍ය පුද්ගලයා බව පත්වීමට දැඩි උදෙ‍යා්ගයෙන් අධිෂ්ඨාන කරමු.

අපගේ තත්වයන් නොසළකා, සතුට සෙවීමට අධිෂ්ඨාන කරමු.

මගේ සාක්ෂිය වන්නේ හෙට ඇතිවන දැඩි කණගාටුවීම් ගැලවුම්කරුවාණන්ව අද අනුගමනයකිරීමෙන් වළක්වාගත හැකි බවය. අප පව්කර හෝ වැරදිකර හෝ තිබේනම්—අප දැන් කණගාටුවන තේරීම්කර තිබේනම්, ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීමෙන් ලැබූ වටිනා දීමනාවක් ඇත, එතුලන් අපට කමාව ලබාගත හැකිය. අපට කාලය තුලින් ආපස්සට ගොස් අතීතය වෙනස්කළ නොහැකිය. නමුත් අපට පසුතැවීමට පුළුවන. අපගේ කණගාටු කඳුළු පිසදාදැමීමට ගැලවුම්කරුවාණන්ට පුළුවන. 12 උන්වහන්සේගේ වන්දිගෙවීම අතීතය පසෙක තබා පිරිසිදු අත්වලින් සහ පිරිසිදු හදවතකින් යුතුව ඉදිරියට යාමට හැකියාවද, 13 යහපත කිරීමට සහ විශේෂයෙන්ම වඩා හොඳවීමටද සලස්සන්නේය.

ඔව්, මෙම ජීවිතය වේගයෙන් ගතවේ; අපගේ දවස් ඉක්මණින් මැලවී යන්නේය; සමහර අවස්ථාවලදී මරණය බියජනක සේ පෙනේ අපගේ ආත්මය දිගටම ජීවත්වෙමින් අමරණීය මහිමය ලබාගැනීමට යම් දිනෙක අපගේ නැවත නැගිටුන ශරීරය සමග එක්වනු ඇත. දයාවන්ත ක්‍රිස්තුස්වහන්සේ නිසා, අප සියල්ලෝම නැවතත් සදාකාලිකවම ජීවත්වන බවට මම ගරුගම්භීරව සාක්ෂිදරමි. අපගේ ගැලවුම්කරුවාණන් සහ මිදුම්කරුවාණන් නිසා, යම්දිනෙක අපට සත්‍යලෙසම මෙම වචනවල අදහස අවබෝධවී එ තුලින් ප්‍රීතිප්‍රමෝදවන්නෙමු, "මරණයේ කටුව ක්‍රිස්තුස්වහන්සේ තුල ගිලගනු ලබන්නේය."14

දෙවියන්වහන්සේගේ පුතුන් සහ දියණියන් ලෙස, අපගේ දිව්‍යමය ගමනාන්තය සම්පූර්ණකිරීමේ මාවත සදාකාලික එකකි. මා ප්‍රිය සොයුරු සොයුරියනි, හිතවත් මිතුරනි, එම සදාකාලික මාර්ගයේ ගමන්කිරීම අප *අද* ආරම්භකළ යුතුය; එක් දිනක්වත් පමාවීම පිළිගැනීමට නොහැකිය. ජීවත්වීමට සත්‍යලෙසම ඉගෙනගැනීමට, අප මරණයට සූදානම්වන තුරු සිටිය යුතු නැතැයි මම යාච්ඤාකරමි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පූජනීය නාමයෙනි, ආමෙන්

**සටහන්**

1. ඇල්මා 40:11.

2. බලන්න සුසී ස්ටිනර්, "Top Five Regrets of the Dying," *Guardian*,පෙබ. 1, 2012, www.guardian.co.uk/lifeandstyle/2012/feb/01/top-five-regrets-of-the-dying.

3. බ්‍රොනී වෙයා, ස්ටිනර් තුලිනි, Top Five Regrets of the Dying."

4. "Ode: Intimations of Immortality from Recollections of Early Childhood," *The Complete Poetical Works of William Wordsworth* (1924), 359.

5. මතෙව් 6:20.

6. ගීතිකා 118:24.

7. ඇන්ටොයිනි ඩි සෙන්ට්-Exupéry, *The Little Prince*, trans. Richard Howard (2000), 63.

8. මොසායා 26:39; තවද බලන්න දහම සහ ගිවිසුම 59:7.

9. දහම සහ ගිවිසුම 78:19.

10. ඇල්මා 26:35.

11. බලන්න එළිදරව් 7:17.

12. බලන්න මතෙව් 11:28–30.

13. බලන්න ගීතිකා 24:4.

14. මොසායා 16:8; තවද බලන්න 1 කොරොන්ති 15:54.

## අපගේ කාලය සඳහා ඉගැන්වීම්

හතරවෙනි ඉරුදිනවල මෙල්කිසදෙක් පූජකවරය සහ සහන සමිතියේ පාඩම් “අපගේ කාලය සඳහා ඉගැන්වීම්” වෙනුවෙන් කැපකරනු ලැබේ. එක් එක් පාඩම මෑතකාලීන ප්‍රධාන සම්මන්ත්‍රනයේ කථා එකකින් හෝ කිහිපයකින් සූදානම්කළ හැකිය. (පහත සහන් සටහන බලන්න). පාවිච්චි කළ යුතු කථාව කුමක්දැයි ස්ටේක් සහ දිස්ත්‍රික් සභාපතිවරුන් තෝරාගනු ඇත. නැතහොත් මෙම වගකීම ඔවුන් සභානායකයාවරයාට හෝ ශාඛා සභාපතිවරුන්ට පවරනු ඇත. මෙල්කිසදෙක් පූජකවරයේ සොහොයුරන් සහ සහන සමිතියේ සොහොයුරියන් එකම කථාව එකම ඉරුදිනක අධ්‍යයනයකිරීමේ වටිනාකම ගැන නායකයෝ අවධාරණයකරනු ඇත.

හතරවෙනි ඉරුදින පාඩම්වලට සහභාගිවන අය, අලුත්ම ප්‍රධාන සම්මන්ත්‍රනය නිකුත්කළ සඟරාව අධ්‍යයනයකර පංතියට රැගෙන ඒමට දිරිගන්වනු ලැබේ.

කථාවලින් පාඩමක් සූදානම්කිරීම සඳහා යෝජනා

ඔබ කථා (වක්) අධ්‍යයනයකර උගන්වන විට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ සමග සිටීමට යාච්ඤාකරන්න. පාඩම සූදානම්කිරීමට වෙනත් කරුණු යොදාගැනීමට පෙළඹවීම් ඔබට ලැබීමට පුළුවන. නමුත් අනුමත විෂයමාලාව සම්මන්ත්‍රන කථාය. ඔබගේ පැවරුම වන්නේ සභාවේ ඉතා මෑතකාලීන ප්‍රධාන සම්මන්ත්‍රණයේ ඉගැන්වූ පරිදි සුභාරංචිය ඉගෙනගෙන ජීවත්වීමට අන් අයට උදව්කිරීමය.

කථා (වක) සමාලෝචනය කිරීමේදී පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන මූලධර්ම සහ ශුද්ධ ලියවිලි සොයන්න. එසේම මෙම සත්‍යයන් ඉගැන්වීමට ඔබට උපකාරවත්වන කථාන්තර, ශුද්ධ ලියවිලි, සහ ප්‍රකාශන කථාවේ (වල) සොයන්න.

මූලධර්ම සහ දහම උගන්වන අන්දම ගැන සටහනක් සාදන්න. පංති සාමාජිකයන්ට උපකාරවත්වන ප්‍රශ්න ඇතුලත්කිරීම ගැන සලකාබලන්න.

කථාවේ (වල) මූලධර්ම සහ දහම සොයන්න.

එහි අදහස් ගැන සිතන්න.

තේරුම්ගැනීම, අදහස්, අත්දැකීම්, සහ සාක්ෂි බෙදාගන්න.

මෙම මූලධර්ම සහ දහම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරන්න.

පාඩම් උගන්වන මාස

හතරවෙනි-ඉරුදින පාඩම් කරුණු

ඔක්තෝබර් 2012–අප්‍රේල් 2013

ඔක්තෝබර් 2012 ප්‍රධාන සම්මන්ත්‍රනයේ කළ කථා*

අප්‍රේල් 2013–ඔක්තෝබර් 2013

අප්‍රේල් 2013 ප්‍රධාන සම්මන්ත්‍රනයේ කළ කථා*

අප්‍රේල් සහ ඔක්තෝබර් හතරවෙනි ඉරුදින පාඩම් සඳහා, කථා (වක්) කලින් තම්මන්ත්‍රනයකින් හෝ ඉතා මෑතකාලීන එකකින් තෝරාගත හැකිය. කථා භාෂා රාශියකින් ලබාගැනීමට යන්න conference.lds.org.